www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

### බුෂ් පරිපාලනය ත්‍රස්ත තර්ජනය පිලිබඳ වාර්තාව නිදහස් කරයි

# ඇමරිකානු මිලිටරිවාදය හා දේශීය මර්දනය සඳහා අලුත් නිමිත්තක්

### Bush administration releases report on terror threat
### A new pretext for American militarism and domestic repression

**බිල් වැන් ඕකන් විසිනි**
**2007 ජුලි 19**

ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගේ "උග්‍රවන තර්ජනයේ වාතාවරනය"කට එක්සත් ජනපදය මුහුන පා සිටින බවට අනතුරු අඟවමින් වොෂින්ටනයේ එකිනෙකට වෙනස් බුද්ධි ආයතන 16ක සොයාගැනීම් සංස්ලේෂනය කරන වාර්තාවක් නව ජාතික බුද්ධි අංශ ඇස්තමේන්තුව (එන්අයිඊ) මගින් ඉදිරිපත් කර තිබේ. බුෂ් පරිපාලනයේ තොරතුරු අනුව, වාර්තාව දැඩි ලෙස අවධාරනය කරන්නේ, එක්සත් ජනපද ආන්ඩුව, පකිස්ථානය හා ඉරානය යන දෙරටෙහි ම නව මිලිටරි මැදිහත්වීම් මෙන් ම රට තුල දේශීය සුපරීක්ෂාව හා අනෙකුත් රාජ්‍ය මර්දනයේ ක්‍රමෝපායන් සුජාත කිරීමේ මං සොයමින් සිටින බවයි.

විධිමත් ලෙස "මව්බිමට එරෙහිව ත්‍රස්තවාදී තර්ජනය" යන සිරස්තලය සහිත වාර්තාවේ වර්ග නොකල සාරාංශය 17 දින නිකුත් කල අතර "ප්‍රධාන තීන්දු" අඩංගු වූයේ පිටු එකහමාරකට අඩු කොටසක ය. සිතාගත හැකි පරිදි ම එන්අයිඊ ප්‍රකාශනය සමග අත්වැල් බැඳගෙන නව ත්‍රස්තවාදී භීතිකාවක් ඇවිලවීම සඳහා මාධ්‍ය ව්‍යාපාරයක් ඇරඹී තිබෙන අතර වාර්තාවේ අඩංගු තොරතුරු හෝ ඒ පිලිබඳ විශ්ලේෂනයක අර්ථයෙන් එහි අලුත් දෙයක් ඇත්තේ නැත. එය, එක්සත් ජනපදයට එල්ල වී ඇති "වඩාත්ම බරපතල තර්ජනය" යන පල්ල ගිය තේමාව යලි වැමෑරීමක් පමනි. එන්අයිඊ හි අඩංගු බඩ දඟලන සුලු "මව්බිම" යන සඳහන ඉස්මතු කිරීම මගින් එය ඇඟිල්ල දිගු කරන්නේ "ඉස්ලාමීය ත්‍රස්තවාදී කන්ඩායම්" විශේෂයෙන්ම අල්කයිඩාවේ කල්ලි වෙතය. වාර්තාවේ වඩාත්ම වැදගත් කොටස් පකිස්ථානයේ තත්වය පිලිබඳව උත්සුකවේ. පකිස්ථාන රජයේ පාලනය යටතේ පවතින ගෝත්‍රික ප්‍රදේශවල ආරක්ෂිත ස්ථානයක් ද ඇතුලුව "මව්බිමට පහරදීම සඳහා අල්කයිඩාවට හැකියාව ලබා දෙන සියලු ප්‍රධාන මූලාශ්‍රයන් එය විසින් යලි සුරක්ෂිත කර ගෙන යලි පනගන්වා තිබේ." යනුවෙන් එය සඳහන් කරයි.

මෙම තනි මතය 18 දා පලවූ *නිව්යෝර්ක් ටයිම්ස්* හා *වෝල්ස්ට්‍රීට් ජර්නල්* යන ප්‍රකාශන දෙකෙහිම ප්‍රධාන මාතෘකාව ලෙස පුලුල්ව වාර්තා විය. එක්සත් ජනපද නිලධාරින් පදනම් කරගෙන ප්‍රකාශන දෙකම ඇඟවුම් කරන්නේ වොෂින්ටනය පකිස්ථානයට සෘජු මිලිටරි මැදිහත්වීමක් සලකා බලන බවයි.

"ඉස්ලමාබාදයේ සහයෝගය ඇතිව හෝ නැතිව මෙම ආරක්ෂිත ස්ථානය මුලිනුපුටා දැමීමේ පීඩනය යටතේ කටයුතු කරන එක්සත් ජනපද ප්‍රතිපත්ති සම්පාදකයන් එය විස්තර කරන්නේ කරදරකාරී උභතෝකෝටිකයක් ලෙස ය"යි ජර්නලය වාර්තා කලේ ය. "පකිස්ථානය තුල පෙන්ටගනය විසින් සිදු කරන ඕනෑම ප්‍රධාන ඒකපාර්ශවික ව්‍යායාමයකට අල්කයිඩාවට එරෙහි සටනේ දී වොෂින්ටනයේ ප්‍රබල මිත්‍ර නායකයා ලෙස ජනාධිපති බුෂ් විසින් හඳුන්වාදුන් ජනාධිපති පර්වේස් මුෂාරෆ් පෙරලා දැමීමට තරම් ප්‍රබල දේශීය ප්‍රති ප්‍රහාරයක් අවුලුවාලිය හැකි යයි එක්සත් ජනපද නිලධාරීහු කියා සිටිති."

මේ අතර *ටයිම්ස්* පත්‍රය වාර්තා කලේ " පකිස්ථානය තුල අල්කයිඩා තර්ජනය සමග ගනුදෙනු කරන්නේ කෙසේ දැයි කිරා මැන බලමින්, ප්‍රසිද්ධ හා රහසිගත මූලාශ්‍ර දෙකම ඇතුලත් කර ගත් නැගීඑන ආක්‍රමනශීලී නව මූලෝපායක් ලෙස සමහරු සඳහන් කල දේ ගැන ඇමරිකානු නිලධාරින් රැස්ව මෑත සතිවල දී සාකච්ඡා කරමින් සිටිති. මඳ වසයෙන් රිදෙන පරිදි අල්කයිඩා ඉලක්ක වෙත පහර දීම නොසෑහෙන බවට වර්ධනය වන උත්සුකයන් පවතින බව ඔවුන් කියා සිටි අතර, එහෙත් ජෙනරාල් මුෂාරෆ් අපහසුතාවට පත් කිරීමෙන් වැලකීම සඳහා සමහර නව ඇමරිකානු පියවරයන් රහසිගතව තිබිය යුතු බවත් කියා සිටිති."

පසුගිය වසරේ දකුනු ලෙබනනයෙහි ඡන්දවලින් සියයට 80ක් ප්‍රමානයක් දිනාගත් මැතිවරන සන්ධානයට ඇතුලත්, ලෙබනනයේ ෂියා මුස්ලිම්වරුන් මත පදනම් වූ දේශපාලනික හා අර්ධ සන්නද්ධ හෙස්බුල්ලාවරු "මව්බිමට" ත්‍රස්තවාදී තර්ජනයක් එල්ල කිරීමේ ශක්‍යතාවයක් ඇති බව ද වාර්තාව කියා සිටී. ඒ, "එම කන්ඩායමට හෝ ඉරානයට එක්සත් ජනපදය සෘජු තර්ජනයක් බවට පත් වීමේ තත්වය තුල ය."

කුමන හෝ සියලුම එවන් ශක්‍ය ප්‍රතිවාදීන්ට එරෙහිව - ආරක්ෂිත යුද්ධයේ බුෂ් ධර්මතාව යටතේ

එක්කෝ සෘජුව හෝ නැතහොත් බලල් අතක් ලෙස යලිත් ඊස්රායලය යොදාගෙන ලෙබනනයට මැදිහත් වීම සඳහා එක්සත් ජනපද මිලිටරි බුද්ධි අංශවල සූදානමක් ඇති බව එය අනුමාන කරයි.

සීඅයිඒ හා අනෙකුත් බුද්ධි අංශ විසින් ධවල මන්දිරය ගැන කෙරෙන විවේචන මඳ වසයෙන් සැඟවුන ඒවා ලෙස පින්තාරු කල ද එන්අයිඊය පෙන්නුම් කරන්නේ ත්‍රස්තවාදී ප්‍රහාරයන්හි වැඩිවන තර්ජනය ඉස්මතු කරවන්නේ ප්‍රධානකොට ම ඉරාක යුද්ධය විසින් බවයි. වක්‍ර හා යම් ආකාරයක වක ගැසුනු භාෂා විලාසයක් වීම නිසා මිස ඉරාක යුද්ධයෙන් ත්‍රස්තවාදයට මරු පහරක් එල්ල කොට ඇතිබවට කෙරෙන නිල ප්‍රකාශවලට මෙම නිගමනයන්ගෙන් වල කපා තිබේ.

"අල්කයිඩාව සිය වඩාත්ම දූෂ්‍යමාන, හැකියාවක් ඇති හා මාතෘභූමියට පහර දීමේ කැමැත්ත පලකොට ඇති බවට දන්නා එක ම පවුලේ සාමාජිකයා වන ඉරාක අල්කයිඩාවේ සම්බන්ධකම් හා හැකියාවන් ලීවරයක් ලෙස යොදා ගැනීමට බලා සිටිනවා විය හැකි"යයි ද, ඊට අමතරව සම්පත් ගොඩනගමින් ද, අවිචාරවත් ලෙස පුහුනු කල බඳවාගත්තවුන්ගෙන් ද සමන්විත පුලුල් අන්තවාදී සුන්නි ජනකොටස මව්බිමට පහර දීම සඳහා දිරිගැන්වීමට, අල්කයිඩාවට ඉරාක අල්කයිඩාව සමග ඇති එහි සම්බන්ධකම් උදව්වක් ව ඇති බවත් අප සැලකිල්ලට ගන්නෙමු." යයි වාර්තාව කියා සිටියි. පසුගිය සැප්තැම්බර් මාසයේ දී මාධ්‍ය වෙත කාන්දු කල සමහර කොටස් ද සහිතව එන්අයිඊහි 2006 අප්‍රේල් මාසයේ වාර්තාවෙහි යොදාගත්තාට වඩා මෙහි භාෂාව සැලකිය යුතු තරමින් වඩාත් රාජ්‍ය තාන්ත්‍රික ය. 2006 වාර්තාව සෘජුව කතා කලේ ය. " මුස්ලිම් ලෝකය තුලට එක්සත් ජනපදයේ මැදිහත් වීම, ජිහාඩ්වරුන්ට පැටවුගසන ගැඹුරු විසංවාදයක් සඳහා හොඳ අවස්ථාවක් බවට ඉරාන ගැටුම පත්ව තිබේ. ඒ සමගම ගෝලීය ජිහාඩ් ව්‍යාපාරයට ආධාරකරුවන් රැස්කර ගැනීමට ද හේතුවක් විය." අබුග්‍රයිබ් හා ගුවන්තනාමෝ හි දුෂ් භාවිතාවන් හා වධ දීම් පිලිබඳ කනස්සල්ලට හේතු වූ එලිදරව් කිරීම් ද හේතු කාරනා වූ බව සඳහන් කෙරේ.

බුද්ධි වාර්තා දේශපාලන අභිමතාර්තයන් සඳහා යොදාගැනීමේ හොඳින් වාර්තාගතව ඇති යට ගිය ඉතිහාසයක් සහිත ධවලමන්දිරයේ පීඩනය මෙම පිලිගැන්වීමේ ඇල් මැරුනු ස්වභාවය හා වකගැසුනු පද සංයෝජනය තුල පිලිබිඹු වනවා නිසැක ය.

ඉරාකය තුල එක්සත් ජනපද මිලිටරිය සටන් වදින්නේ "සැප්. 11 අපට පහර දුන් එම මිනිසුන්" සමඟ ම ය. යන බුෂ්ගේ මුග්ධ ප්‍රකාශයන් යලි ඇදබෑම වාර්තාව නිකුත්වීමේ අවස්ථාව ඔහු යොදා ගත්තේ ය.

අන්ධාකාර කාර්යාලයේදී වාර්තාකරුවන්ට කල ප්‍රකාශයන්හි දී බුෂ් යලි වතාවක් තර්ක කලේ ඉරාක යුද්ධය අවශ්‍යයෙන්ම අල්කයිඩාවට එරෙහි සටනක් බවය. "2001 සැප්. 11 දින ප්‍රහාරයට නියෝග දුන් එම මිනිසාට ම මෙම මිනිසුන් දිව්රුම් දී පක්ෂපාත වෙති. එනම් ඔසාමා බින් ලාඩන් ය. ඉරාකය වැනි ලෝකයේ ස්ථානවලින් අප ඉවත්වනවා දැකීම ඔවුන්ගේ අවශ්‍යතාව යි. එවිට ඔවුන්ගේ විෂඝෝර දෘෂ්ටිවාදය පැතිරවිය හැකි ආරක්ෂිත ස්ථාන ඔවුන්ට පිහිටුවා ගත හැකි ය. ඇමරිකානු ජනතාව පමනක් නොව මෙම නැවුම් ප්‍රජාතන්ත්‍රවාදයන් ද ආරක්ෂා කිරීමට අප නොසැලෙන අධිෂ්ඨානයෙන් පසුවෙමු." යයි ඔහු කියා සිටියේ ය.

එන්අයිඊ වාර්තාව නිකුත්වූ දිනයට පසු දා ම බැග්ඩෑඩයේ එක්සත් ජනපද අනදෙන මධ්‍යස්ථානය ඉරාකයේ ඉහලම අල්කයිඩා නායකයා අල්ලා ගත් බවත් ඔහු, ඔසාමා බින් ලාඩන්ගේ අල්කයිඩා සංවිධානය ඉරාක කන්ඩායම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් පවත්වන බව ඇඟවුම් කරන තොරතුරු සපයා ඇති බවත් නිවේදනය කිරීම බැලූබැල්මට පෙනී ගියේ අනපේක්ෂිත අහම්බ සිදුවීමක් ලෙස ය.

කරුනු අනුව පෙනීගියේ, අල්ලාගැනීමේ නිවේදනය අහම්බයකට වඩා අඩු දෙයක් විය හැකි බවත්, කියාපාන ඉරාක අල්කයිඩා නායකයා නිසැකව ම අල්ලා ගත්තේ සති දෙකකට වත් පෙර බවත් ය.

බුෂ්ගේ ධවල මන්දිර තර්කයෙහි කැපීපෙනෙන දෝෂය වන්නේ 2003 එක්සත් ජනපද ආක්‍රමනයට පෙර ඉරාකය තුල අල්කයිඩාව නොපැවතියේ ය. යන කාරනය යි. තවද, ඇමරිකාවේ විජිතකරන හමුදාවන්ට පහර දීම සඳහා ඉරාක ජනතාව තුල පවතින පුලුල් සහයෝගය හා මෙම ප්‍රහාරයන්ට අල්කයිඩාව සමග මොනම සම්බන්ධයක් වත් නැති පුද්ගලයන් හා කන්ඩායම්වල පුලුල් පෙල ගැසීම ආවරනය කිරීමට, එක්සත් ජනපද හමුදා සටන්වදින්නේ මෙම ත්‍රස්තවාදී සංවිධානයේ සාමාජිකයන් සමග ය යන පරිපාලනයේ තොරතෝංචියක් නැති කියාපෑම් යොදාගෙන ඇත.

වියයුතු පරිදිම ඩිමොක්‍රැටිකයන් තමාගේ පැත්තෙන් වාර්තාව අල්ලාගෙන ඇත්තේ "ත්‍රස්තයට එරෙහි ගෝලීය යුද්ධය" සදොස් ලෙස කලමනාකරනය පිලිබඳව බුෂ්ගේ ධවලමන්දිරයට දොස් නැගීමටත්, ඉරාකයේ එක්සත් ජනපද වාඩිලෑමේ පරිමානය කැපීමේ සිය ඉල්ලීම ඉදිරියට ගැනීමටත්, ඇෆ්ගනිස්ථානයේ සහ සමහර විට වෙනත් තැන්වල එක්සත් ජනපද මැදිහත් වීම උත්සන්න කිරීමත් සමග සම්බන්ධ කිරීමට ය.

ඉලිනොයිස්හි ඩිමොක්‍රැටික් සෙනෙට් සභික හා ජනාධිපති අපේක්ෂක බරාක් ඔබාමාගේ ප්‍රතිචාරය සංකේතාත්මකය. "සය වසරකට තරම් පසුව නිල ඇඳුමින් සැරසුනු අපගේ නිර්භීත මිනිසුන් හා ගැහැනුන් විසින් කරන ලද භයංකර කැපකිරීම්වලින් හා ඩොලර් බිලියන ගනන් වැය කිරීමෙන් පසුව ද සැප්. 11 ට වඩා

අප සුරක්ෂිත නැත. මෙය වූකලී, කිසි විටෙකත් බලය නොපවරනු ලැබූ හා අපගේ මාතෘ භූමියට සෘජු තර්ජනයක් එල්ල කර ඇති අන්තවාදී ජාලයන්ට කල් පවතින හානියක් සිදු කිරීමේ අවස්ථාව පැහැරහැරියා වූද ඉරාකය තුල නොමග යැවූ යුද්ධයක් ගෙනයෑමේ ද ප්‍රතිවිපාකය" යයි ඔහු ප්‍රකාශ කලේ ය.

සැප්තැම්බර් 11 කොමිසමේ මෙන්ම ඉරාක අධ්‍යයන කන්ඩායමේ සම සභාපතිත්වය දැරුවා වූ හිටපු කොන්ග්‍රස් සභික ලී හැමිල්ටන් එම අවශ්‍ය කාරනයම අතිශයෝක්තියෙන් තොර භාෂාවකින් ගෙනහැර දැක්වී ය.

ජූලි 11 දින වාර්තාකරුවන් අමතමින් ඔහු අවධාරනය කලේ වොෂින්ටනය, ඉරාක ආක්‍රමනය සඳහා එහි මිලිටරි සම්පත් මාරුකලවිට ඇෆ්ගනිස්ථානයේ අල්කයිඩාව විනාශ කිරීමේ " අවස්ථාව මගහැරුනේ ය" යනුවෙනි. "ඉරාකයට යෑමත් සමග අප අවමංගතවූයේ ය" යි ඔහු කීවේ ය.

ඉරාක යුද්ධය හුදෙක් ම අල්කයිඩාවට එරෙහි සටනක් ලෙස පින්තාරු කිරීමට බුෂ් පරිපාලනයේ උත්සාහය සමග ඔහු මෙම ප්‍රශ්නය එකට ගත්තේය. " මා සිතන්නේ සතුරු විකාශනය වෙමින් නිරන්තරයෙන් වෙනස් වෙමින් හා බහු මුහුනුවරක් ගෙන ඇති බවයි. ඉරාකය තුල සතුරා වෙන්කොට දැක්වීම ඉතා දුෂ්කර ය" යි ඔහු කියා සිටියේ ය.

එක්සත් ජනපද ජාතික ආරක්ෂක මන්ඩලයේ හිටපු ප්‍රධාන ත්‍රස්තවිරෝධී උපදේශක රිචඩ් ක්ලාක් කියා සිටියේ එන්අයිහි වර්ග නොකල සංස්කරනය " නියම ගැටලුවකට" සමාන බවයි.

ක්ලාක් තර්ක කලේ වඩාත් සිත් ඇදගත්තේ වාර්තාව කියාසිටින දේට වඩා නොකියා ඇති දේ බවයි. එන්අයිර්හි 2006 හා ඉන් පෙර වාර්තා සැලකිල්ලට ගන්නා ඔහු අවධාරනය කලේ එක්සත් ජනපදයේ ත්‍රස්ත විරෝධී කටයුතුවලින් "අල්කයිඩා නායකත්වයට බරපතල අලාභහානි සිදු කර ඇති බවත් එහි කටයුතු කඩාකප්පල් කර ඇති බවත්" ය.

"2007 දී එය තවදුරටත් එසේ නොවේ. අප හුදකලාවී ඇත්තේ කෙසේ දැයි වටහා ගැනීම සඳහා ඔබට පේලි අතර කියවීමට සිදු වේ. අප ඉරාකය ආක්‍රමනය කරන තෙක් එහි අල්කයිඩාව නොසිටියේ ය යන්න ගත හොත් අප ඉරාකයට යෑම එක්සත් ජනපදයට තවත් තර්ජනයක් නිර්මානය කර ඇත්තේය. යන නිගමනය කරා නොඑලඹ සිටීම දුෂ්කර ය"යි ඔහු කියා සිටී.

බුෂ්ගේ මව්බිමෙහි ආරක්ෂක උපදේශක ෆ්‍රැන්සිස් ටවුන්සෙන්ඩ් මෙම තර්කයන්ට අපූර්ව නිෂ්ප්‍රභාකිරීමක් ඉදිරිපත් කලේ පරිපාලනයේ ප්‍රතිපත්ති විවේචකයන් "ත්‍රස්තයට එරෙහි යුද්ධය දැකගෙන ඇත්තේ (එක පිලක අවාසිය අනෙක් පිලට වාසි සැලසීමෙන් අවසන් වන) "ශූන්‍ය ජෙඩ්‍යයක" ක්‍රීඩාවක් ලෙස ය.

"කාරනය වන්නේ අප ඇෆ්ගනිස්ථානයේ දී ඔවුන්ට අඩන්තේට්ටම් කලෙමු. ඉරාකයේ දී අප ඔවුන්ට අඩන්තේට්ටම් කලෙමු. අප අනෙකුත් ක්‍රමවලින්, මිලිටරි නොවන ක්‍රමවලින් ලෝකය වටාම ඔවුන්ට අඩන්තේට්ටම් කලෙමු. පිලිතුර වන්නේ ඔබ ප්‍රකෝපකාරීත්වය අවුස්සන සෑම විටෙකම ඔවුන් ආපසු පැමින ඔබගේ පිටුපසින් තල්ලු කරන බවය" යි ඇය පැවසුවා ය.

"අඩන්තේට්ටම් කිරීම" යන්න මෙම මෙහෙයුම් විස්තර කිරීමට සුදුසු වචනයක් කට එල්ල කරන ප්‍රහාරයන්ට ප්‍රකෝපකරනයක් ඇවිස්සීම යන සාදෘෂ්‍යය සම්බන්ධ යථාර්ථය නම් එක්සත් ජනපදයේ ඉරාක යුද්ධය සමග එකට යමින් වධ දීම් හා "අත්‍යසාමාන්‍ය නිරූපනයන්" හා අනෙකුත් සාපරාධී ක්‍රමවේදයන් යොදාගැනීම මගින් නිර්මානය කර ඇත්තේ ලෝකය පුරා මිලියන ගනන් මුස්ලිම්වරුන්ගේ මෙන්ම අනෙකුත් කොටස්වල ද උග්‍ර විරෝධයකි. සමහර අවස්ථාවල දී අල්කයිඩාව සමග කිසිදු සම්බන්ධයක් නැති මිනිසුන් විසින් සිදු කරන ත්‍රස්තවාදී ක්‍රියා ඉහල යාමට තුඩු දී ඇත.

මෙය එන්අයිඊ වාර්තාව තුල මත් සඳහන් වේ. එය ප්‍රකාශ කරන්නේ "බටහිර රටවල රැඩිකල් කන්ඩායම්වල ඉහල නැගීම ඇගවුම් කරන්නේ එක්සත් ජනපදය ද ඇතුලත් බටහිර, මුස්ලිම් ජනතාව අතර රැඩිකල් හා ප්‍රචන්ඩ කොටස පුලුල් වෙමින් පවතින බවයි."

මෙම තීන්දුව මර්දනය හා සුපරික්ෂාකාරීත්වය තවත් උත්සන්න කිරීම සඳහා පදනම බවට පත්වනු ඇත. මෙය අරාබි හා මුස්ලිම් රටවලින් එක්සත් ජනපදයට සංක්‍රමනය වන ජනතාවට පමනක් නොව, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන්ට මෙන් ම ඉරාකයේ හා ඇෆ්ගනිස්ථානයේ සිදු කෙරෙමින් පවතින එක්සත් ජනපද සාහසිකත්වය ට එරෙහිවන සියල්ලන් මත ම යෙදෙනු ඇත.

එක්සත් ජනපදය තුල ම දේශපාලන තාඩනපීඩනවල උපකරයක් ලෙස දිගට ම ත්‍රස්තවාදය යොදාගැනීමට වොෂින්ටනය බලාපොරොත්තු වන බව, ජාතික බුද්ධි අංශ තක්සේරුව නිකුත් කිරීම මගින් සලකුනු කරනවා පමනි. ඒ සමග ම ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් යන දෙකොටසම වාර්තාවට දක්වන ප්‍රතිචාරයෙන් පැහැදිලි කෙරෙන්නේ ඉරාකයේ උපායන් හා මූලෝපායන් පිලිබඳ කටුක විවාදය තිබිය දී ම ප්‍රධාන පක්ෂ දෙකෙහි ම පිටුබලය සහිතව ඇමරිකානු මිලිටරිවාදයේ නව ක්‍රියාකාරකම් සූදානම් කෙරෙමින් තිබෙන බවයි.


© www.wsws.org